# අවුරුදු උදානය

මහින්ද දිසානායක දිවුල්ගනේ

මුළු පරිසරයම අමුතුම ප්‍රභෝදයක් ලබයි. ගස්වල කොල හැලී නව දළු රිකිලි හා එල දරයි. සෞභාග්‍යයෙන් පිරි කාලයක් වෙයි. විශේෂයෙන් එරබදු මල් පිපී කොවුලන්ගේ කෑගැසීම ගැමි පරිසරයට අවුරුදු කැඳවයි. එදා සිට පැවත ආ සංස්කෘතිකමය මේ අවුරුදු උත්සවය අද දක්වාම අපි මහත් ඉහලින් හරසරින් පැවැත්වීමට සැදී පැහැදී සිටිමු. එය යම් ජාතියක පැවැත්මට හා අනෙකුත් ජාතීන්ගෙන් වෙනස්වීමටත් අපේ අනන්‍යතාව පෙන්වීමටත් වැදගත් වේ. මෙහිදී විශේෂයෙන්ම වැදගත් වන්නේ මේ අවුරුද්ද හා බැඳුනු චාරිත්‍ර වාරිත්‍ර හා වත් පිළිවෙත්ය. ජාතික සමගිය සුහද බව නෑදෑකම් තරකැ ගැනීමට මේ උත්සවය වක්‍ර ලෙසින් සමාජයට ආශිර්වාදයක් වේ.

අප සුපුරුදු ලෙස වසරක් පාසා සෙන්ට් ඕල්බන්ස් සිංහල භාෂා පාසල පවත්වන අවුරුදු උත්සවය මෙවරත් පෙර මෙන් සංවිධානය කොට පැවැත්වීම වැදගත් වේ අප බටහිර වික්ටෝරියා ශ්‍රී ලංකා බෞද්ධ සංගමය හා භාෂා පාසලේ සංවිධායක මණ්ඩලය විශේෂයෙන්ම පාරමිතා අප පාසලේ මූලිකත්වයෙන් මේ ජාතික උත්සවය පැවැත්වීමට කටයුතු කරයි. මෙහි අරමුණු කීපයක් ගැන කතා කරන විටදී මුලින්ම ශ්‍රී ලාංකික දරුවන්ට ජාතික උත්සවය ගැන දැනුමක් ලබා දීමටත් එම චාරිත්‍ර පිළිපැදීමත් සෑම දෙනාගේ ම එකමුතු බව වැඩි දියුණු කිරීමත්ය. විශේෂයෙන් අප සැලකිලිමත් විය යුත්තේ මෙවැනි රටක ජීවත් වීමේදීය. එසේ නොවුනහොත් එම දුවා දරුවන් සංස්කෘතික දෙකක් අතර අතරමං වීමට සිදුවීම නොවැලැක්විය හැක්කකි. අනෙක් අතට මොනයම් හෝ සංස්කෘතියක් හෝ අපට ගැලපෙන්නාවූ යමක් ගතයුතු හරයක් තිබේනම් ඒවා අපේ ජීවිතවලට එකතු කරගැනීම හානියක් නොවේ. ඒ වගේම තවත් කරුණක් වන්නේ මෙහි තරුණ පරපුර යම් යම් මොවැනි සංස්කෘතික කටයුතුවලට යොමු කිරීම තුලින් දැනුමක් උකහාගන්නවා වගේම තරුණ සිත යම් වැරදි මාර්ගවලින් වලක්වා ගැනීමේ හැකියාවත් තිබේ.

මෙවැනි සංස්කෘතික උත්සව සිංහල භාෂා පාසලෙන් පැවැත්වීම අගය කළයුතු මහඟු කාර්යයක් වේ. එසේ වන්නේ එයින් දරුවන්ගේ භාෂා ඥාණය පමණක් නොව දරුවකුට ලැබිය යුතු දැනුම, ආකල්ප කුසලතා දියුණුවටද හේතුවේ. ඒ තුලින් සමාජය අපේක්ෂා කරන පිරිපුන් මිනිසෙකු එනම් රටකට ජාතියකට අවශ්‍ය මිනිසෙකු යහපත් අයෙකු බිහිකරයි. ඔවුන් ලබා දිය යුත්තේ අධ්‍යාපනය පමණක්ම නොව සමාජ සම්බන්ධතා සමාජ ලැදිකම් හා පෞරුෂ වර්ධනය යන මේ කරුණුය.

අවුරුද්ද යන වචනය ඇසෙන විටදී දැනෙන සතුට ඉමහත්ය. දවස් තුන්සිය හැටපහක් එසේ නැතිනම් මාස 12ක් (දොලොස් මාසයක්) ගතවන තැන උදාවන්නේ අප එතෙක් කාලයක් බලාගෙන සිටි බක් මාසයේ උදාවයි. බක් මාසය යනු අවුරුදු කාලයයි. අපේ පැරැන්නන් ජීවත් වූයේ ගොවිතැන මූලික සමාජ ක්‍රමයක් හා අර්ථ ක්‍රමයක් පසුබිම් කරගත් පරිසරයක් තුලය. කාලයක් තම ගත සිත කුඹුරට හේනට යොදවා අස්වනු නෙලීම ගොවැතැනින් ජීවත් වන ඔවුන්ට ආශිර්වාදයකි. ඒ අස්වැන්නෙන් මුලින්ම බුදුන්ට දෙයියන්ට පූජා පවත්වා අනතුරුව ඔවුන්ගේ පරිභෝජනයට ගනී. මේ කාලය එනම් අස්වැන්න ගෙට ගන්නා කාලය මානසික ව සුවයක්ද ඇති කරයි. අවුරුද්ද එළඹෙන්නේ ඉන් පසුවයි. හැම ගෙදරකම පාහේ අටුකොටු සරුවී බත බුලතින් සරුවී සතුට උතුරා යයි. එක් අතකින් බක් මාසය අර්ථ ගන්වන්නේ භාග්‍යවන්ත මාසය යනුවෙනි.

සිංහල අවුරුද්ද තුල වැඩි ඉඩකඩක් වෙන් වන්නේ එදින පැවැත්වෙන සිරිත් චාරිත්‍ර වාරිත්‍ර වලටය. බුලත් හුරුල්ලක් දී දෙගුරුන් නැමදීම වැඩිහිටියන් හට ආචාර කිරීම, අසල්වාසීන් ගමේ පිරිස හා නෑදැයන්ට කැවිලි පෙවිලිවලින් සංග්‍රහ කිරීම යන මේ චාරිත්‍ර විධීන් සමාජ යහපැවැත්ම සඳහා මෙන්ම එකිනෙකා අතර අන්‍යෝන්‍ය සම්බන්ධතා ඇති කිරීම සඳහාද පදනම් වේ අවුරුදු දා පැවැත්වෙන එයටම ආවේනික වූ කෙළිසෙල්ලම් ද මෙහිදී විශේෂ තැනක් ලබා ගනී. මේ කෙලිසෙල්ලම් තුලින් ජය පාරාජය සමව විඳ ගැනීම පමණක් නොව ඔවුනොවුන් අතර හිතවත්කම් සම්බන්ධතාද වැඩි දියුණු කරගත හැකි වේ. පැරණි කාලයේ අවුරුදු ක්‍රීඩා අතර ඔන්චිල්ලා, චක්ගුඩු පැණීම, ඔළිඳ කෙලිය, අං පොරය, ආදී එකිනෙකට වෙනස් වූ ක්‍රීඩා තිබූ අතර අද වර්තමානයේදී ඊට සමාන්තරව තවත් අළුත් ක්‍රීඩාවන් ඒ සඳහා පැමිණ ඇත. පැරණි සමහර ක්‍රීඩාවන් ඉවත් වී ඒ සඳහා අළුත් ක්‍රීඩා එකතුවීම නොවැලැක්විය හැක්කකි. ඒ අතරට දිවීම, ක්‍රිකට් ගැසීම, කොට්ට පොර වැනි ක්‍රීඩා ඔලිඳ කෙලිය, පංච දැමීම වැනි පැරණි ක්‍රීඩා ඉවත් වී ඒ ස්ථානයට පැමිණ තිබේ. සමාජ වර්ධනයත් සමඟ එවන් වෙනස් වීම පැමිණිය හැකි වේ. මෙහි අවසන් අරමුණ විය යුත්තේ සමඟි සම්පන්න සදාචාරාත්මක වූ සමාජයකි.

වසර ගණනාවක සිට පවත්වාගෙන එන අපේ සෙන්ට්බිල්බන්ස් සිංහල භාෂා පාසලේ වාර්ෂික අවුරුදු උළෙල මෙවරද ඉතා සාර්ථක ලෙස පැවැත්වීමට සංවිධායක මණ්ඩලය විශේෂයෙන් එහි සංවිධායකතුමා ඇතුලු සියලු සාමාජික සාමජිකාවන් ගෙන් ආදරණීය දෙමාපියන් හා දරුවන්ගේත් පාරමිතා බෞද්ධ විහාරයේ විහාරාධිපති අපේ ගරු සාස්ත්‍රපති පල්ලේවෙල දේවරක්ඛිත හාමුදුරුවන්ගේත් මග පෙන්වීම වැදගත් වේ. අපේ ශ්‍රී ලාංකික දරුවන්ට පාසැල තුලදී අකුරු කියාදීම පමණකන්ම සෑහිමකට පත්විය නොහැකිය. බාහිර වූ ක්‍රියා කාරකම්ද මා මුලදී සඳහන් කලාක්මෙන් ජීවන හා චරිත වර්ධනය සඳහා අත්‍යාවශ්‍ය වේ. විශේෂයෙන් ඒ සඳහා අපේ ජාතික උත්සව ප්‍රමුඛත්වයක් උසුලයි. ඒ අතරිනුත් මේ අළුත් අවුරුදු උත්සවයට හිමිවන්නේ විශේෂ තැනකි. විශේෂයෙන් මේ රටේ උපන් ශ්‍රී ලාංකික දරුවෙකුට මේ උත්සවය ඔහුගේ ජීවිතයට අළුත් අත්දැකීමක් එකතු කරයි. තමාගේ පවිලේ වටපිටාව පාසැලට සීමා වී තිබූ අත්දැකීම් තවත් තමාගේම අළුත් පිරිසකගේ සම්බන්ධය තුලින් වැඩිදියුණු කරගැනීමට හැකිවේ. ගෙදරට පමණක් සීමාවී තිබූ දරුවෙකුට මෙය සුවිශේෂිත වූ අවස්ථාවක් වේ දෙමාපියන් ඇසුරේ මෙවන් පරිසරයක් තුල හැදුනු වැඩුණු දරුවෙකුට බටහිර සමාජයක් හමුවේ නොමඟ යෑමේ ප්‍රවණතා විරල වේ. අපේ සිංහල භාෂා පාසල හා සම්බන්ධ වූ ප්‍රාදේශීය අපේ දරුවන්ට පමණක් නොව දෙමාපියන්ටද කාලයකින් හිත මිතුරන් මුණ ගැසීමට ඔවුන් හා විනෝද වීමට අදහස් සම්පව බෙදා හදා ගැනීමේ මහඟු අවස්ථාවක්ද උදා වෙයි. පාසලට සම්බන්ධ වූවනට පමණක් සීමා නොවී අවට ප්‍රදේශවල ජීවත්වන ශ්‍රී ලාංකිකයනටද සුහදව හමුවී මිතුරුකම් වැඩිදියුණු කරගැනීමේ මාර්ගයක්ද සැලසීම මෙහි අතුරු ප්‍රතිපලයකි. 2014 වසරේ අප්‍රේල් 6 වෙනි ඉරුදින දවස පුරාවට පවත්වන්නේ පෙර වසරේ මෙන්

Station Road Deer Park SASSELLA PARK GROUND හිදියි. (ME.R – 25-E -6)

අප පාරමිතා බෞද්ධ විහාරයට සම්බන්ධිත, පාසලට සම්බන්ධ විශේෂයෙන් බටහිර වික්ටෝරියා ශ්‍රී ලංකා අප බෞද්ධ සංගමයට හා ප්‍රාදේශීය ජනතාවට මෙදිනට අප හා මෙම අවුරුදු උත්සවයට සහභාගීවන ලෙස කාරුණිකව ආරාධනා කරනු කැමැත්තෙමු.

වැඩිදුර විමසීම් -
විහාරස්ථානය - 97471902
බණ්ඩාරනායක (සංවිධායක) -
0425855621



සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර www.thisara.com